De mezenod college - kandana De mezenod college - kandana De mezenod college - kandana De mezenod
ද මැසිනොද් විදුහල - කඳාන ද මැසිනොද් විදුහල - කඳාන ද මැසිනොද් විදුහල - කඳාන De
mezenod college - kandana De mezenod college - kandana De mezenod college - kandana De ද
මැසිනොද් විදුහල - කඳාන ද මැසිනොද් විදුහල - කඳාන ද මැසිනොද් විදුහල - කඳාන
mezenod college - kandana mezenod college - kandana mezenod college - kandana mezenod college

# ද මැසිනොද් විදුහල - කඳාන
# De mezenod college - kandana

| 21 | s | I |
|---|---|---|

2024.06

## පළමු වාර පරීක්ෂණය
## 2024

11 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය I

කාලය පැය 1 යි

De mezenod college - kandana De mezenod college - kandana De mezenod college - kandana De mezenod
ද මැසිනොද් විදුහල - කඳාන ද මැසිනොද් විදුහල - කඳාන ද මැසිනොද් විදුහල - කඳාන ද මැසිනොද් විදුහල - කඳාන De
mezenod college - kandana De mezenod college - kandana De mezenod college
mezenod ද මැසිනොද් විදුහල - කඳාන ද මැසිනොද් විදුහල - කඳාන ද මැසිනොද් විදුහල - කඳාන ද මැසිනොද්
විදුහල - කඳාන

නම ........................................................................ පන්තිය ................................... අංකය .................

- **සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

**(01) සිදුහත් කුමරුට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූයේ,**

(1) කසී භාරද්වාජ බමුණුතුමාය. (2) දිසාපාමොක් බමුණු තුමා ය.
(3) සර්වමිත්‍ර බමුණුතුමාය. (4) කාලදේවල බමුණුතුමාය.

**(02) සමග්ගා හෝථ හා විවදථ යනුවෙන් විවාද නොකොට සමගි වන ලෙස බුදුන් වහන්සේ කලහකාරි භික්ෂූන්ට දේශනා කළහ. මෙයින් ප්‍රකට වන්නේ,**

(1) සමගිව වැඩ වාසය කිරීමයි. (2) විවේචනාත්මකව කටයුතු කිරීමයි.
(3) පක්ෂපාතීව කටයුතු කිරීමයි. (4) ආරක්ෂාකාරීව කටයුතු කිරීමයි.

**(03) සිදුහත් බෝසතාණන් වහන්සේ ගිහි ගෙය හැර යාමට හේතු වූ කරුණක් නොවන්නේ.**

(1) සතර පෙර නිමිති දැකීමයි. (3) නාටිකාංගනාවන්ගේ විප්‍රකාර දැකීමයි.
(2) රාහුල කුමරුගේ උපත සිදුවීමයි. (4) අන්‍ය තීර්ථකයන්ගේ බලපෑමයි.

**(04) බුදුරජාණන් වහන්සේ පළමු වන වස් කාලය ගත කළේ.**

(1) බරණැස ඉසිපතනාරාමයේදී ය. (2) කොසඹෑ නුවර ඝෝෂිතාරාමයේදී ය.
(3) පාරිලෙය්‍යනයේදී ය. (4) වේරංජා නුවරදී ය.

**(05) බුදුන් වහන්සේ රෝග වැළඳීමට හේතු අටක් දේශනා කරනු ලැබුවේ.**

(1) සාරිපුත්ත හිමියන්ට ය. (2) සුභද්‍ර හිමියන්ටය.
(3) චන්න හිමියන්ට ය. (4) ගිරිමානන්ද හිමියන්ට ය.

**(06) සිගාලෝවාද සූත්‍රයේ අන්තර්ගත ආකාරයට එකිනෙකාට ඉටු කළ යුතු යුතුකම් හා සාර ධර්ම ප්‍රමාණය වන්නේ.**

(1) 61 කි (3) 41 කි
(2) 60 කි (4) 40 කි

**(07) බෝසතාණන් වහන්සේ වීර්ය පාරමිතාව පූර්ණය කළ බව හෙළිවන ජාතකය වන්නේ,**

(1) සිවි ජාතකයයි. (3) කුස ජාතකයයි.
(2) කපි ජාතකයයි. (4) වණ්ණුපථ ජාතකයයි.

**(08) පුද්ගලයාගේ නිදහස් චින්තනය හා විමංසනය පිළිබඳ අයිතිය අගය කරමින් බුදුරජාණන් වහන්සේ කේසපුත්ත නියම් ගම් වැසියන්ට දේශනා කළ සූත්‍රය වන්නේ,**

(1) කාලාම සූත්‍රයයි. (2) වීමංසක සූත්‍රයයි.
(3) චූල්ලකම්ම විභංග සූත්‍රයයි. (4) රතන සූත්‍රයයි.

(09) බුද්ධ ශාසනයේ ධර්ම භාණ්ඩාගාරික තනතුර හිමි වූයේ,

(1) සීවලී හිමියන්ටය.
(2) කාළුදායි හිමියන්ටය.
(3) ආනන්ද හිමියන්ට ය.
(4) උපාලි හිමියන්ට ය.

(10) බුදුරජාණන් වහන්සේගේ උපස්ථායකවරු ගණයට අයත් නොවන්නේ,

(1) සැරියුත් හිමියන්ය.
(2) නාගිත හිමියන්ය.
(3) උපවාන හිමියන්ය.
(4) සුනක් ඛත්ත හිමියන්ය.

(11) බුද්ධ දේශනාවට අනුව අපට වැළඳෙන රෝග දෙයාකාරය. ඒවා නම්.

(1) මානසික රෝග හා චර්ම රෝගයි.
(2) වසංගත රෝග හා මානසික රෝගයි.
(3) හිසෙහි රෝග හා කුසෙහි රෝගයි.
(4) කායික රෝග හා මානසික රෝගයි.

(12) විදර්ශනා භාවනාවෙන් ලැබිය හැකි උසස්ම ප්‍රතිඵලය වන්නේ.

(1) නීවරණ ධර්ම යටපත් වීමයි.
(2) නිර්වාණය අවබෝධ වීමයි.
(3) පංච අභිඥා අෂ්ඨ සමාපත්ති උපදවා ගැනීමයි.
(4) සිත එකඟ වීමයි.

(13) පංචස්කන්ධය යනු,

(1) රූප, වේදනා, සඤ්ඤා, උපාදාන, විඤ්ඤාණ
(2) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ
(3) රූප, වේදනා, උපාදාන, භව, සංඛාර
(4) රූප, වේදනා, සඤ්ඤා, විඤ්ඤාණ, නාම රූප

(14) යමක් කිරීමෙන් පසු තැවෙන්නට සිදු නොවේ ද, යමක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුතුව විඳිය හැකි වේද, යන අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් දෙපදය දැක්වෙන පිළිතුර වන්නේ.

(1) සුඛරානි අසාධූනි - අත්තනෝ අහිතානිච
(2) තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති
(3) අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මෙ
(4) අප්පමාදෝ අමත පදං - පමාදෝ මච්චුනෝ පදං

(15) බුදු දහමේ දැක්වෙන පරිදි " හේතු පටිච්ච සම්භූතං හේතු භංගා නිරුජ්ජති. මේ අදහස ප්‍රකට වන බෞද්ධ සංකල්පය වන්නේ.

(1) පුබ්බේකත හේතු වාදයයි.
(2) අකිරිය වාදයයි.
(3) අහේතු අප්පච්චය වාදයයි.
(4) පටිච්ච සමුප්පාදයයි.

(16) ඓතිහාසික කැලණි රජ මහා විහාරස්ථානයේ චෛත්‍ය රාජයාණන් වහන්සේ ඉදිකොට ඇති හැඩය

(1) බුබ්බුලාකාරය.
(2) පද්මාකාරය.
(3) ඝටාකාරය.
(4) ධාන්‍යාකාරය.

(17) දුගී පවුලක උපත ලැබුව ද ඉහළ මට්ටමේ රූප සෝභාව හේතුවෙන් වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට උදා වන්නේ.

(1) පයෝග සම්පත්තියෙනි.
(2) ගති සම්පත්තියෙනි.
(3) උපධි සම්පත්තියෙනි.
(4) කාල සම්පත්තියෙනි.

2024-06
9. 11

(18) මම පොත් රචනා කළේ මුදල් හම්බ කිරීමේ අදහසින් නොවේ. මගේ පොතක් වෙන කවුරුන් හෝ මාණ පිළිඳුට මගේ පොත්වල කොටස් උපුටා ගත්තාට මගේ කිසිම විරුද්ධත්වයක් නැහැ තම පොත් පිළිබඳව ප්‍රකාශ කලේ

(1) අනගාරික ධර්මපාලතුමාය.
(2) වැලිවිට අසරණ සරණ සංඝරාජ හිමියන්ය.
(3) බලංගොඩ ආනන්ද මෛත්‍රී මහා නාහිමියන්ය.
(4) රේරුකානේ චන්ද විමල මහා නාහිමියන්ය.

(19) බුදුරජාණන් වහන්සේගේ ද්‍රෝණයක් පමණ ධාතූන් වහන්සේලා තැන්පත් කොට රජතුමා විසින් ඉදි කරනු ලැබුවේ.

(1) අභයගිරි චෛත්‍යය යි.
(2) ජේතවන චෛත්‍යය යි.
(3) මිරිසවැටි චෛත්‍යය යි.
(4) රුවන්වැලි චෛත්‍යය යි.

20) පුද්ගලයාගේ මෙලොව පරලොව ජීවිතය පිරිහීමට කරුණු ඇතුළත් සූත්‍රයක් වන්නේ.

(1) දස ධම්ම සූත්‍රය යි.
(2) අග්ගි වච්ඡගොත්ත සූත්‍රය යි.
(3) පරාභව සූත්‍රය යි.
(4) අනන්ත ලක්ඛණ සූත්‍රයයි.

(21) සිව්වනක් පිරිස අනුපිළිවෙළින් දක්වීමේදී නිවැරදි පිළිවෙළ වන්නේ.

(1) භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා
(2) භික්ෂු, භික්ෂුණී, උපාසිකා, උපාසක
(3) භික්ෂු, උපාසක, භික්ෂුණී උපාසිකා
(4) භික්ෂු උපාසිකා, භික්ෂුණී, උපාසක

(22) වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ නාහිමියන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ අතරට ඇතුළත් නොවන ග්‍රන්ථය වන්නේ,

(1) ධර්ම විනිශ්චය ය.
(2) සතර බණවර සන්නය ය.
(3) මුණිගුණාලංකාරය ය.
(4) සාරාර්ථ සංග්‍රහය ය.

(23) බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතූන් වහන්සේ තැන්පත් කර දෙවන පැතිස් මහරජ විසින් ගොඩ නැගූ බෞද්ධ ස්තූපය වන්නේ.

(1) ගිරිහඩු සෑයයි.
(2) මහියංගණ චෛත්‍යයි.
(3) ථූපාරාම චෛත්‍යය යි
(4) සෝමවතී චෛත්‍යයි.

(24) මහින්දාගමනයේ ප්‍රතිඵලයක් වශයෙන් සැලකිය නොහැකි කරුණක් වන්නේ.

(1) දේශීය භික්ෂු සමාජය ආරම්භ කිරීමයි.
(2) මහා විහාරය කේන්ද්‍ර කර ගත් අධ්‍යාපනයක් ඇරඹීම යි.
(3) රාජ්‍ය පාලනය භික්ෂූන් වහන්සේලා අතට ගැනීම යි.
(4) චිත්‍ර හා මූර්ති කලාවක් බිහිවීම යි.

(25) "මාගේ මේ ව්‍යායාමය නිර්මල බුදු සසුනේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකින් රජ සැප පිණිස නොවන්නේය. මෙම සටන් පාඨය පෙරදැරි කරගෙන කටයුතු කළ රාජ්‍ය පාලකයා.

(1) විලගම්බා රජතුමාය.
(2) මහසෙන් මහ රජතුමා ය.
(3) ධාතුසේන මහ රජතුමාය.
(4) දුටුගැමුණු මහ රජතුමාය.

(26) රේරුකානේ චන්දවිමල මහානාහිමිපාණන් වහන්සේ විසින් රචිත ග්‍රන්ථයක් නොවන්නේ,

(1) පොහොය දිනයයි.
(2) ධර්ම විනිශ්චයයි.
(3) අභිධර්ම මාර්ගයයි.
(4) සාරාර්ථ සංග්‍රහයයි.

(27) "සම්බුදු සසුන බේරා ගැනීමට තවත් විසිපස් වතාවක් මේ දඹදිව ඉපදේවා ' යන පැතුම.

(1) අසරණ සරණ සංඝරාජ මාහිමියන්ගේ ය.
(2) සිරි දේවමිත්ත ධර්මපාල මාහිමියන්ගේ ය.
(3) මිගෙට්ටුවත්තේ ගුණානන්ද මාහිමියන්ගේ ය.
(4) තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන්ගේ ය.

(28) ත්‍රිවිධ ශික්ෂා වලට ද ආර්ය ධන සතට ද දස පින් කිරියවත්වලට ද දස රාජ ධර්ම වලට ද දස පාරමිතා වලට ද පොදු වන දහම් කරුණක් වන්නේ,

(1) දානයයි.
(2) සීලයයි.
(3) භාවනාවයි.
(4) ශ්‍රද්ධාවයි.

(29) සත්ත්වයා උසස් පහත් වශයෙන් බෙදනු ලබන්නේ.

(1) ජාතිය මගිනි.
(2) ආගම මගිනි.
(3) කුලය මගිනි.
(4) කර්මය මගිනි.

(30) අනාත්ම ලක්ෂණය පැහැදිලි කරන්නේ පහත කුමන ප්‍රකාශයෙන් ද?

(1) නොවෙනස්ව පවතින "මම " යැයි පදාර්ථයක් නැත.
(2) සහේතුක කිසිවක ස්ථිර පැවැත්මක් නොමැත.
(3) වෙනස් වන සියලු දේ අප්‍රසන්න විඳීම් ලබා දේ.
(4) ලොව සියලු ම දෙයට අනන්ත පැවැත්මක් ඇත.

(31) පාලියෙන් පැවති ත්‍රිපිටක බුද්ධ ධර්මය සංස්කෘත භාෂාවට පරිවර්තනය කිරීම, මධ්‍ය ආසියාවේ ධර්ම ප්‍රචාරය සඳහා ධර්ම දූතයන් යෙදවීම යන ප්‍රතිඵල දැකිය හැකි වන්නේ.

(1) දෙවන ධර්ම සංගායනාවේ දී ය.
(2) තෙවන ධර්ම සංගායනාවේ දී ය.
(3) කණිෂ්ක ධර්ම සංගායනාවේ දී ය.
(4) අළුවිහාර සංගායනාවේ දී ය.

(32) සිල් රැකීමේ ආනිශංස පහක් පිළිබඳ බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත. එම පහට අයත් නොවන පිළිතුර තෝරන්න, සිල්වත්තයා.

(1) මහත්වූ භෝග සම්පත් අත්පත් කරගනියි.
(2) මරණින් මතු සුගතියේ උපදියි.
(3) ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළැඹෙයි.
(4)ගින්නෙන් හා වස විසවලින් වැළකෙයි

(33) බුදුරජාණන් වහන්සේ මංගල ධර්ම දේශනයේ දී කණ්හාව ආකාර තුනක් වන අයුරු දේශනා කොට ඇත. එහි භව තණ්හාව යනුවෙන් හඳුන්වා ඇත්තේ.

(1) කම්සැප විඳීමට ඇති ආශාවයි.
(2) පරලොවක් නැත යන විශ්වාසයයි.
(3) මම හෙවත් ආත්මය පිළිබඳ අශාවයි.
(4) මෙලොව හැකිතාක් කම්සැප විඳීමයි.

(34) යුද ගැටුම් බහුල කාලයක් වීම, දුර්භික්ෂ කාලයක් ඇතිවීම, භික්ෂූන් ශාසනික පිළිවෙත්වලින් බැහැර වීම හා කණ්ඩායම් දෙකකට බෙදීම, රාජ්‍ය අනුග්‍රහය නොලැබීම යන හේතු ප්‍රධාන වශයෙන් බලපෑවේ.

(1) දෙවන ධර්ම සංගායනාවටයි.
(2) තෙවන ධර්ම සංගායනාවටයි.
(3) අළුවිහාර ධර්ම සංගායනාවටයි.
(4) කණිෂ්ක

2024.06
ශ්‍රේ.11

(35) ඡර්හයේ හැඩය අනුව ප්‍රධාන වශයෙන් ස්තූප සයාකාර වේ. "දිය බුබුලක හැඩය" ගනිමින් නිර්මාණය කළ ස්තූප වර්ගය හඳුන්වන්නේ,

1. බුබ්බුලාකාර ලෙස ය.
2. ඝටාකාර ලෙස ය.
3. පද්මාකාර ලෙස ය.
4. ආමලකාර ලෙස ය.

(36) නිවන් මඟට පිවිසෙන පුද්ගලයෙකු විසින් අනුගමනය කළ යුතු නිවැරදි අනුපිළිවෙළ සහිත වරණය තෝරන්න.

1. ප්‍රඥා, සීල, සමාධි, සද්ධා
2. සද්ධා, සීල, සමාධි, ප්‍රඥා
3. සීල,සමාධි, සද්ධා, ප්‍රඥා
4. සමාධි, සද්ධා, සීල, ප්‍රඥා

(37) බුදුදහම ව්‍යාප්ත නොවූ බටහිර රටවලට පසු කාලයේ දී දැනුම ලබාදීම පිණිස එංගලන්තයේ පාලි පොත් සමාගම නිර්මාණය වුයේ කිනම් ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙසද?

1 ප්‍රථම ධර්ම සංගායනාවෙනි.
2. තෙවන ධර්ම සංගායනාවෙනි
3. හතරවන මහායාන ධර්ම සංගායනාවෙනි
4. දෙවන ධර්ම සංගායනාවෙන

(38) සිංහල සාහිත්‍යයට නව අරහාදී බුදු ගුණවල "' අරහං ගුණය " තේමා කරගෙන පූජාවලිය නම් ග්‍රන්ථය රචනා කළේ.

1. ගුරුළුගෝමී පඬිතුමාය.
2. විද්‍යා චක්‍රවර්තී පඬිතුමා ය
3. ධර්මසේන හිමියන් ය.
4. මයුරපාද පිරිවෙන්හි බුද්ධ පුත්‍ර හිමියන්ය.

(38) සප්ත අපරිහාණිය ධර්ම වලට ඇතුළත් නොවන කරුණ මින් කුමක්ද?

1. නිතර නිතර රැස්වීම
2. සමගිව රැස් ව සමගිව විසිරයාම
3. කාන්තාවන්ට ආරක්ෂාව සැළසීම
4. පෙර නොපැනවූ නීති පැනවීම හා පනවන ලද නීති කඩ නොකොට ආරක්ෂා කිරීම

(39) ගසක මල් හටගෙන ක්‍රමයෙන් පිපි කලක් පැවත පරවී යයි. මෙම ස්වභාවය පෙන්නුම් කරන බෞද්ධ ඉගැන්වීම.

1. දුක්ඛ ධර්මතාවයයි.
1. දසරාජ ධර්මයයි
3. අනිත්‍ය ධර්මතාවයයි
4. හිරි ඔත්තප්ප ධර්මතාවයයි.

(40) බුදු දහමේ ඉගැන්වෙන පරිදි ධාර්මික පාලකයෙකු අනුගමනය නොකළ යුතු කරුණක් වන්නේ,

1. සතර සංග්‍රහ වස්තුවයි
2. අනාත්ම ධර්මතාවයයි.
3. සතර අගතියයි
4. සප්ත අපරිහානි ධර්මයයි

2024.06



දි මැසිනොද් විදුහල - කඳාන

De mezenod college - kandana

| 11 | B | II |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය

2024

11 ශ්‍රේණිය

බුද්ධ ධර්මය I - II

කාලය පැය 2 යි

➢ පළමු කොටසෙහි සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය යතු අතර දෙවන කොටසෙහි තෝරා ගත්ප්‍රශ්න හතරක් සඳහා පිළිතුරු සැපයිය යුතුය.

1 කොටස

I. **"මෙවන් පුතෙකු ලද මවක් පියෙක් නිවුනෝ වෙති"** ආදී වශයෙන් නිබ්බුත පද පවසනු ලැබුවේ කවුරුන් විසින්ද ?

....................................................................................................

II. "භාවේති කුසල ධම්මෙ ආසේවති වඩ්ඪේති එතායතානි භාවනා" මෙම ගාථාවේ අදහස ඔබේ වචනයෙන් ලියා දක්වන්න…....................................................................................

....................................................................................................

III. බුද්ධ වචනය අනුව රෝග දෙයාකාර වේ එම කොටස් දෙක නම්කරන්න ?

....................................................................................................

IV. නිබද්ධ චාරිකා යනුවෙන් හඳුන් වන්නේ කුමක්ද ?

....................................................................................................

V. බුදු දහමේ උගන්වන කුසල මූල තුන නම් කරන්න.

....................................................................................................

VI. සමථ භාවනාව වැඩීමෙන් ලැබිය හැකි උසස්ම ප්‍රතිපල දෙකක් නම් කරන්න.

....................................................................................................

VII. යෙ ධම්මා හෙතුප්පවා - තේසං හේතුං තථාගතෝ ආහ

තෙසංච යෝ නිරෝධෝ - ඒවං වාදී මහා සමණෝ

මෙම ගාථාවෙන් හෙළි කෙරෙන බුදු දහමේ ඉගැන්වෙන ධර්මකරුණ කුමක්ද ?

....................................................................................................

VIII. බුදු දහමේ අනාගතය රඳා පවතින්නේ සිවුවනක් පිරිස මතය. සිව්වනක් පිරිස නම් කරන්න.

....................................................................................................

IX. පූජාවලිය සහ සද්ධර්ම රත්නාවලිය යන ග්‍රන්ථ රචනා කළ කතුවරුන් ගේ නම් සඳහන් කරන්න.

....................................................................................................

X. බුදුන් වහන්සේ වජ්ජී රජ දරුවන්ට හඳුන්වා දුන් රාජ්‍ය ප්‍රතිපත්තිය කුමක්කද ?

....................................................................................................

## 2 කොටස

1.
   I. හතරවන සංගායනාව හැඳින් වීම සඳහා භාවිතා කරන වෙනත් නමක් සඳහන් කරන්න.
   II. මෙම සංගායනාව පැවැත්වීමට බලපෑ හේතු මොනවාද ?
   III. එම ධර්ම සංගායනාව පැවැත්වීම ශාසනික චිරස්ථිතියට හේතු වූ ආකාරය පැහැදිලි කරන්න.

2.
   I. පාරමී යන්නෙහි අර්ථය ලියන්න.
   II. බුදුබව පතන බෝසතානන් වහන්සේලා පාරමිතාවක් සම්පූර්ණ කරන ආකාර තුන ලියන්න.
   III. පාරමී ගුණ දමෙන් සිසු දිවිය සරසමු යන මාතෘකාව යටතේ පාසල් බෞද්ධ සඟරාවකට ලියන ලිපිය සකස් කරන්න.

3.
   I. **"උට්ඨාන මතෝ සතිමතෝ**
   **සුචිකම්මස්ස නිස්සම්ම කාරිනෝ "**
   ඉහත ධම්ම පද ගාථාවේ ඉතිරි කොටස නම් කරන්න.
   II. එහි තේරුම ඔබේ වචනයෙන් ලියන්න.
   III. මෙම ධම්ම පද කථාව ආදර්ශයක් කර ගෙන තරුණ ජීවිතය සාර්ථක කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

4.
   I. සිව්පසය නම් කරන්න.
   II. මහා සංඝරත්නයෙන් සිදුවන ආගමික, ජාතික හා සාමාජීය සේවාවන් දෙක බැගින් ලියන්න.
   III. ජීවිතයේ උපතේ සිට මරණය දක්වාම මගපෙන්වීම හා ආශිර්වාදය ලබා දෙන මහා සංඝරත්නය රැක ගැනීම යුතුකමක් බව නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

5.
   I. බුදුන් වහන්සේ සත්හට වන බව දූකට වෙදාණන් යනුවෙන් හඳුන්වන්නේ ඇයි ?
   II. උදරාබාදයකින් පෙළුණු භික්ෂුවකට උපස්ථාන කිරීමෙන් පසු බුදුන් වහන්සේ භික්ෂූන් රැස් කරවා ලබා දුන් අවවාදය කුමක්ද ?
   III. රෝගීන්ට උපස්ථාන කිරීම ඔබේ සමාජ ජීවිතයේ දියුණුවට මෙන්ම අධ්‍යාත්මික ගුණධර්ම වර්ධනයට ඉවහල් වන ආකාරය පෙන්වා දෙන්න.

6. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පමණක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
   I. ශ්‍රීමත් අනගාරික ධර්මපාල
   II. වටදාගෙය
   III. අටලෝදහම
   IV. කර්මය